සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, මධ්‍ය වාර පරීක්ෂණය, 2020 මාර්තු
General Certificate of Education (Adv. Level), Grade 13, Mid Term Test, March 2020

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
# Communication and Media Studies - I

29 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය : ......................................................................

*සැලකිය යුතුයි.*

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්ණයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරැදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය සපයා දෙන කොටු පත්‍රයේ කතිරයක් යොදා දක්වන්න.**

(01) සන්නිවේදන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ,
(1) සන්නිවේදකයා ය. (2) ග්‍රාහකයා ය.
(3) නාලිකාව යි. (4) පණිවිඩය යි.
(5) බලපෑම යි.

(02) දෙවන ලෝක යුද්ධය සඳහා සන්නිවේදනය විවිධ ආකාරයෙන් යොදා ගෙන ඇත. එම යුද්ධය සඳහා මූලිකව බලපෑ පුද්ගලයා වූයේ,
(1) ඇඩොල්ෆ් හිට්ලර් ය. (2) ජොෂප් ස්ටාලින් ය.
(3) ඒබ්‍රහම් ලින්කන් ය. (4) ජොහැන්ස් ගුටෙන් බර්ග් ය.
(5) ජෝෂප් ගොබෙල්ස් ය.

(03) සන්නිවේදනයේ ස්වභාවය හඳුන්වා දීමේ දී නොගැළපෙන අදහස වන්නේ,
(1) සන්නිවේදනය අරමුණු සහගත වීම. (2) සන්නිවේදනය විසම්මුතිය මත ඇති වීම.
(3) සන්නිවේදනය විවිධාකාර වීම. (4) සන්නිවේදනය සන්දර්භයානුගත වීම.
(5) සන්නිවේදනය බලයක් සහිත වීම.

(04) ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව නමින් පාඨමාලාව ආරම්භ කිරීමට පුරෝගාමී ආචාර්යවරයා වූයේ,
(1) විමල් දිසානායක (2) සුනන්ද මහේන්ද්‍ර
(3) එම්. බී. ආරියපාල (4) එඩ්වින් ආරියදාස
(5) අයි. එම්. ආර්. බී. ඊරියගොල්ල

(05) සන්නිවේදන ආකෘති මඟින් සිදු කරන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමේ දී සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,
(1) සන්නිවේදන ක්‍රියාවලියේ විද්‍යමාන වන දෙය සාරාංශ කර දැක්වීම.
(2) තොරතුරු ගලායාම පෙන්වීම.
(3) සන්නිවේදනයේ රේඛීය බව පෙන්වීම.
(4) සන්නිවේදනයේ හා ග්‍රාහකයාගේ ස්වරූපය හා ප්‍රබලත්වය පෙන්වීම.
(5) සන්නිවේදනයේ ස්වභාවය හා අවශ්‍යතාව, අවස්ථාව ආදිය හඳුනාගැනීම.

(06) සමාජ විද්‍යාඥයන්ගේ මතය අනුව ජනශ්‍රැති තුළින් සමාජ ආර්ථික සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කළ හැකි ය. මෙය වඩාත් සමීප වන්නේ,

(1) මනෝ විද්‍යාත්මක අධ්‍යයනයට ය.
(2) මානව විද්‍යා අධ්‍යයනයට ය.
(3) පුරාවිද්‍යාත්මක අධ්‍යයනයට ය.
(4) සමජ විද්‍යා අධ්‍යයනයට ය.
(5) ඉතිහාස අධ්‍යයනයට ය.

(07) පුද්ගලයෙකුට පණිවිඩයක් නිසියාකාරව අවබෝධ කර ගැනීමට හා අර්ථකථනය කර ගැනීමට හැකියාව ඇති වන්නේ, මාධ්‍ය

(1) විචාරය තුළිනි.
(2) විශ්ලේෂණය තුළිනි.
(3) ඇගයීම තුළිනි.
(4) සාක්ෂරතාව තුළිනි.
(5) සංස්ලේෂණය තුළිනි.

(08) නිර්මාණාත්මක සංදේශයක දැකිය හැකි වඩාත්ම වැදගත් ලක්ෂණය වන්නේ,

(1) අපූර්වත්වයය යි.
(2) කල්පිත බව යි.
(3) විචිත්‍ර බවයි.
(4) ප්‍රාසාංගික බව යි.
(5) චිත්‍ර රූප මැවීම යි.

(09) ග්‍රාහකයා පිළිබඳ සදොස් ප්‍රකාශය වන්නේ,

(1) ග්‍රාහක සාක්ෂරතාව සම මට්ටමේ නොපැවතීම.
(2) ග්‍රාහකයා සමජාතික වීමයි.
(3) ග්‍රාහකයා සංදේශයෙන් පමණක් බැඳීම යි.
(4) ග්‍රාහකයාගේ වින්දන ක්ෂෙත්‍රය විවිධ වීම යි.
(5) ග්‍රාහකයාට නායකත්වයක් නොමැති වීමයි.

(10) මහජන සම්බන්ධතා පිළිබඳ ව නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) සුබවාදී දැනුම්වත් කිරීම මූලික අරමුණ යි.
(2) සබඳතා ගොඩ නැංවීම මූලික කාර්ය යි.
(3) අන්‍යොන්‍ය විශ්වාසය තහවුරු කිරීම ප්‍රමුඛ වේ.
(4) මුදල් ගෙවා සිදුකරන ප්‍රවර්ධන කාර්යයකි.
(5) විවිධ පාර්ශවවලට වාසි ගෙන දෙන්නකි.

(11) අතීතයේ දී මහජන සම්බන්ධතා සිදු කළ විවිධ පුද්ගලයන් පිළිබඳ තොරතුරු හෙළි වේ. ඊට අදාළ වැදගත්ම සාධකය වන්නේ,

(1) ඉරාකයේ කීලාක්ෂර වළ තොරතුරු ය.
(2) මෙසපොටේමියාවේ මැටි පුවරු ය.
(3) අල්ටමීරා ගුහා චිත්‍රය
(4) චීනයේ මුද්‍රණ කර්මාන්තය යි.
(5) බ්‍රිතාන්‍යයේ රජ පවුලේ කාර්යභාරය යි.

(12) සන්නිවේදනය පණිවිඩ ප්‍රති නිර්මාණය වීමේ ක්‍රියාවලියක් බව පෙන්නුම් කළේ,

(1) විල්බර් ශ්‍රාම් ය.
(2) හැරල්ඩ් ලැස්වෙල් ය.
(3) ෂැනොන් වීවර් ය.
(4) චාල්ස් කූලී ය.
(5) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය යි.

(13) ගෝලීය සංස්කෘතියේ හැඩ ගැසීම ආරම්භ වන්නේ,

(1) ගුටෙන්බර්ග්ගේ මුද්‍රණ යන්ත්‍රයෙනි. (2) චීනයේ කඩදාසි නිර්මාණයෙනි.

(3) 1950 දශකයේ පසුව ය. (4) 18 වන සියවසේ අග භාගයේ දී ය.

(5) සීසර්ගේ යුධ සමයේ ය.

(14) පුවත්පතක දෘශ්‍ය ආකර්ශනය වඩාත් ප්‍රබල ලෙස යොදාගත හැකි වන්නේ,

(1) කෙටි වාක්‍ය මඟිනි. (2) සරල බස් වහරක් මඟිනි.

(3) දෘඪ පුවත් මඟිනි. (4) ඡායාරූප හා වර්ණ මඟිනි.

(5) දෙබස් හා සංවාද මඟිනි.

(15) සංස්කෘතිය යනු සාමාජිකයන්ගේ ජීවන ක්‍රමයට එනම් ඔවුන් විසින් ඉගෙන එක් රැස්කොට ගත්තා වූත් බෙදා හදාගෙන පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යනු ලැබුවාවූත් අදහස් උදහස් හා පළපුරුදු ය. මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) කැස්පර් මැලිනොවුස්කිය (2) එඩ්වර්ඩ් ටයිලර් ය.

(3) රැල්ෆ් ලින්ටන් ය. (4) මාග්‍රට් මීඩ්ය.

(5) වෙබ්ස්ටර් ශබ්ද කෝෂය යි.

(16) සන්නිවේදනය ක්‍රියාවලිය මූලික අංග පහක් ඔස්සේ රේඛීය ව පාලනය වන ආකාරය පෙන්වා දෙන ලද්දේ,

(1) විල්බර් ශ්‍රාම් ය. (2) ක්ලෝඩ් ෂැනොන් ය.

(3) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය. (4) චාල්ස් කුලි ය.

(5) හබ් ආකෘතිය යි.

(17) මාධ්‍ය පරිහරණයට අවබෝධ කර ගැනීමට විවේචනාත්මකව ඇගයීමට අන්තර්ගතය නිර්මාණය කිරීමට ඇති හැකියාව මාධ්‍ය සාක්ෂරතාව බව ඉදිරිපත් කොට ඇත්තේ,

(1) ජේම්ස් පෝටර් විසිනි. (2) මැක්බ්‍රයිට් වාර්තාව මඟිනි.

(3) ඇමෙරිකානු සන්නිවේදන කොමිසම යි. (4) විල්බර් ශ්‍රාම් විසිනි

(5) යුරෝපා කොමිසම යි.

(18) ජන සන්නිවේදනය මගින් ඉටු කරන ප්‍රයෝජන හතරක් ජනමාධ්‍ය අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය. ඊට අයත් නොවන්නේ,

(1) ප්‍රජානනය යි. (2) අපසරණය ය.

(3) නිෂ්කර්ෂනය ය. (4) වියුක්තිකරණය ය.

(5) සමාජ උපයෝගීතාවය ය.

(19) සන්නිවේදන ක්‍රියාවලිය තුළ පවතින අඛණ්ඩව තම සන්නිවේදන ආකාරය මගින් විස්තර කර ඇත්තේ ,

(1) හැරල්ඩ් ලැස්වෙල් ආකෘතිය මගින් (2) ඇරිස්ටෝටල ආකෘතිය මගින්

(3) ෂැනොන් සහ වීවර් ආකෘතිය මගින් (4) HUB ආකෘතිය මගින්

(5) විල්බර්ශ්‍රාම් ආකෘතිය මගින්

(20) ඔබ මහජන සම්බන්ධතා නිලධාරියකු යැයි සිතන්න. ඔබගේ සේවය අවශ්‍ය වන අවස්ථා කීපයක් පහත දැක්වේ.

- රජය මගින් අලුතින් ආරම්භ කිරීමට යෝජිත නව ව්‍යාපෘතියක් පිළිබඳ මහජනතාවට විස්තරාත්මකව පැහැදිලි කිරීම.
- වසර තුනකින් පසු පැවැත්වීමට නියමිත පළාත් සභා ඡන්දය සඳහා ඉදිරිපත් වීමට උනන්දුවෙන් පසුවන තරුණ සමාජ ක්‍රියාකාරිකයෙකු හඳුන්වා දීම.
- විදුලි රැහැනක අලුත්වැඩියාවක් සඳහා විදුලි සැපයුම සති අන්තයේ දී අත්හිටුවීම පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම.

ඉහත අවස්ථා සඳහා ගැළපෙන ක්‍රියාකාරකම්වල අනුපිළිවෙළ වන්නේ,

(1) මාධ්‍ය සාකච්ඡාව, ප්‍රතිරූපය ගොඩ නැංවීම, මාධ්‍ය නිවේදනය

(2) මාධ්‍ය නිවේදනය, මාධ්‍ය සාකච්ඡාව, ප්‍රතිරූපය ගොඩ නැගීම

(3) මාධ්‍ය නිවේදනය, ප්‍රතිරූපය ගොඩනැංවීම, මාධ්‍ය සාකච්ඡාව

(4) මාධ්‍ය නිවේදනය, මාධ්‍ය සාකච්ඡාව, ප්‍රතිරූපය ගොඩනැංවීම

(5) ප්‍රතිරූපය ගොඩ නැංවීම, මාධ්‍ය සාකච්ඡාව, මාධ්‍ය නිවේදනය

❍ **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට ආකෘතිය ඇසුරෙන් පිළිතුරු දෙන්න.**




(21) ඉහත ආකෘතිය හඳුන්වන්නේ,

(1) රේඛීය නොවන ආකෘති ලෙසය, (2) ව්‍යුහමය ආකෘති ලෙස ය.

(3) ගණිතමය ආකෘති ලෙස ය. (4) චක්‍රීය ආකෘති ලෙස ය.

(5) සමාජීය ආකෘති ලෙස ය.

(22) ඉහත ආකෘතියට සමාන ආකෘතියක් ඉදිරිපත් කරන ලද්දේ,

(1) විල්බර් ශ්‍රාම් (2) ෂැනොන් සහ වීවර් (3) ඩේවිඩ් කේ බර්ලෝ

(4) හැරල්ඩ් ලැස්වෙල් (5) ඇරිස්ටෝටල්

(23) ඉහත ආකෘතියෙහි I හි බලපෑමෙන්,

(1) A අසාර්ථකත්වයට පත් වේ. (2) C අසාර්ථකත්වයට පත් වේ.

(3) D අසාර්ථකත්වයට පත් වේ. (4) F අසාර්ථකත්වයට පත් වේ.

(5) G අසාර්ථකත්වයට පත් වේ.

(24) මෙහි C හි කාර්යභාරය වන්නේ,

(1) මූලාශ්‍රයක් ලෙස ක්‍රියා කිරීම යි. (2) සංදේශය නිර්මාණය කිරීම යි.

(3) බාධා ගෙන ඒම යි. (4) සම්ප්‍රේෂණාගාර ලෙස ක්‍රියා කිරීම යි.

(5) අග්‍රස්ථානය යි.

(25) ඉහත ආකෘතිය අනුව E යනු,

(1) ලැබූ සංඥාවයි. (2) අග්‍රස්ථානය යි. (3) ග්‍රාහකයා යි.

(4) විකේතකරණය යි. (5) සංදේශය යි.

(26) සන්නිවේදන උපකරණයක් ලෙස ගැමි මාධ්‍ය තුළ දැකිය නොහැකි වන්නේ,

(1) ජන විඥානයට සමීප වීම යි. (2) සංවිධානගත බව යි.

(3) අවම පිරිවැය යි. (4) සක්‍රීය සහභාගිත්වය යි.

(5) සරල ව්‍යුහය යි.

(27) නව මාධ්‍ය භාවිතයේ පිරිවැය අවම වීම නිසා,

(1) ග්‍රාහකයා ප්‍රචණ්ඩ වීමට හේතු වී ඇත.
(2) අධ්‍යාපන ක්‍රියාවලියට භාවිතකර ඇත.
(3) ගෘහ ජීවිතය ආක්‍රමණය කර ඇත.
(4) පුද්ගලයා හුදෙකලා වී ඇත.
(5) මාධ්‍ය සාක්ෂරතාවය ඉහළ ගොස් ඇත.

(28) ඩෙංගු වසංගතය පිළිබඳ ඉදිරිපත් කළ වීදි නාට්‍යයක දී ඩෙංගු සන්නිය නමින් සාම්ප්‍රදායික සන්නිවේදනයක් සිදු කරන ලද අතර ගැමියන් තුළ එය වඩාත් ජනප්‍රිය විය. ඊට බලපෑ කරුණ වූයේ,

(1) නර්තනය නැරඹීමට ඇති කැමැත්ත
(2) සන්නිවේදන බාධා අවම වීම යි.
(3) යකුන් කෙරෙහි පවතින අධික බිය යි.
(4) ජන විශ්වාසයටන්ට වඩාත් සමීප වීම යි.
(5) ප්‍රතිකාර ක්‍රම පිළිබඳ ලැබෙන අවබෝධය යි.

(29) සමාජ මාධ්‍යයක් ලෙස මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ දී දේශපාලකයෝ ෆේස් බුක් භාවිත කරති. ඒ සඳහා බලපාන අවම සාධකය වන්නේ,

(1) ක්ෂණික ප්‍රතිචාර ලබා ගැනීම.
(2) ව්‍යාපාරික අවශ්‍යතා ඉටු කර ගැනීම.
(3) ක්ෂණිකව සම්බන්ධ කර ගත හැකි වීම.
(4) ප්‍රතිරූප ඉහළ නංවා ගැනීම
(5) අවම පිරිවැයක් වීම.

(30) නිර්මාණාත්මක චින්තනය ක්‍රියාදාම හතරක් ඔස්සේ සිදු වේ. ඊට අදාළ නොවන්නේ

(1) සතතාභ්‍යාසය (2) සකස් කිරීම (3) පෝෂණය
(4) ප්‍රදීපනය (5) සත්‍යාපනය

(31) නිර්මාණය යනු අලුත් යමක් නිපදවීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලිය යි. මෙය ඉදිරිපත් කළේ,

(1) ලියනාඩෝ ඩාවින්චි (2) ජේම්ස් පෝටර්
(3) විල්බර් ශ්‍රාම් (4) යුනෙස්කෝව
(5) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

(32) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මුද්‍රිත මාධ්‍යයේ දී ලිඛිත භාෂාව ප්‍රමුඛ වන අතර දෘෂ්‍ය රූප ද භාවිත වේ.
(2) සිනමාවේ භාෂාව රූපය වන අතර ව්‍යාකරණය සංස්කරණය යි.
(3) නව මාධ්‍යවල සියුම් ලෙස නිර්මාණාත්මක භාෂාව භාවිත කළ හැකි ය.
(4) භාෂාවේ නිර්මාණශීලීත්වය මුද්‍රිත මාධ්‍යයට වඩා නව මාධ්‍යය තුළ දැකිය හැකි ය.
(5) සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍ය තුළ නිර්මාණාත්මක භාෂාව වඩාත් දැකගත හැකි ය.

(33) කැමරා කෝණ පිළිබඳ න්‍යායාත්මක වර්ගීකිරීමේදී යම් චරිතයක හෝ වස්තුවක් මතුකර දැක්විය යුතු ලක්ෂණ ඉතා සමීපව දැක්වීම හඳුන්වන්නේ

(1) දුර රූප ලෙස ය. (2) උඩුකුරු දැක්ම ලෙස ය.
(3) යටිකුරු දැක්ම ලෙස ය. (4) අති සමීප රූප ලෙස ය.
(5) සමීප රූප ලෙස ය.

(34) අන්තර් සංස්කෘතික සන්නිවේදනයේ වඩාත් වැදගත් කාර්යය වන්නේ,

(1) තම සංස්කෘතික අනන්‍යතාව උත්කර්ෂයට ලක් කිරීම.

(2) මානව කේන්ද්‍රණවාදය ඉහළ නැංවීම.

(3) මිනිසා අවට ලෝකයට අනුවර්තනය කර ගැනීම.

(4) සංස්කෘතික විසරණය තේරුම් ගැනීම.

(5) බහු සංස්කෘතික සමාජයක් ගොඩ නංවා ගැනීම.

(35) පුවත්පත් සංස්කාරකවරයෙකුට ලැබුණු ලිපියක අක්ෂර වින්‍යාස හා උක්ත ආඛ්‍යාත දෝෂ සහිත වාක්‍යය ද දැකිය හැකිව තිබුණි. එහි සඳහන් නිවැරැදි වාක්‍යය කුමක් ද?

(1) ශීඝ්‍රගාමී බසයට මහල්ලා යට විය.

(2) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ඨ ලේඛකයකු විය.

(3) අසල පන්ති කාමරයෙහි කිසිවෙකු නොසිටිය හ.

(4) තෙල් පැටවූ බවුසරය ගිනි ගන්නා සුළු ය.

(5) සාම මණ්ඩලයට සියළු සාමාජිකයන් පැමිණෙයි.

(36) ගෝලීය සම්ප්‍රදාය යන සංකල්පය 1981 දී ප්‍රථමයෙන් භාවිතයට ගන්නා ලද්දේ,

(1) ඩේවිඩ් වයිට් ය.
(2) විල්බර් ශ්‍රාම් ය.
(3) ඩේවිඩ් රොසෙන්බර්ග් ය.
(4) මාර්කස් පර්සියස් කැටෝ ය.
(5) ජෝන් මැක්ලීන් ය.

(37) ඵලදායී සන්දේශයක් සඳහා බලපාන ප්‍රධාන ගුණාංග හතරට අයත් නොවන්නේ,

(1) සරල බව
(2) විශේෂත්වය
(3) සුවිදර්ශය
(4) ව්‍යුහය
(5) ඇලීම

(38) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වේ.

(2) රූපණය පුද්ගල බද්ධ සංසිද්ධියක් ලෙස සැලකිය හැකි ය.

(3) රංග භූමිය හා රංග කලාව සහයෝගිතා කලාවකි.

(4) ප්‍රවෘත්ති රචනයේ දී සරල සෘජු වැකි සහිත භාෂාවක් භාවිත කෙරේ.

(5) නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතිය මඟින් නිරූපණය කරයි.

(39) මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ ව ගුවන්විදුලි සාකච්ඡාවක් තුළ ඉදිරිපත් වූ මතවාද කීපයක් පහත දැක්වේ.

A - ස්වභාවික ක්‍රියාවලියකට වඩා සැළසුම් කරන ලද ක්‍රියාවලියකි.

B - බටහිර සංස්කෘතිය මූලාශ්‍රය කර ගෙන ඇත.

C - මාධ්‍ය තාක්‍ෂණය සමඟ ප්‍රතිවිරුද්ධව ඇත.

D - සමාජ ගතිකවලට අනුව හැඩ ගැසේ.

ඉහත අදහස් අතරින් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි.
(2) A B C D යන සියල්ල ම
(3) A B C පමණි.
(4) B C D පමණි.
(5) AB D පමණි.

(40) සමකාලීන නූතන මානවයාගේ පරිණාමයේ දී සැලකිය යුතු සංස්කෘතික ප්‍රභේද සමූහයක් නිර්මාණය වී ඇත. ඊට අයත් නොවන්නේ,

(1) සාම්ප්‍රදායික සංස්කෘතිය (2) විරෝධී සංස්කෘතිය
(3) ජන සංස්කෘතිය (4) සම්භාව්‍ය සංස්කෘතිය
(5) මාධ්‍ය සංස්කෘතිය

(41) ආයතනික මහජන සම්බන්ධතාවයේ දී අවධානය යොමු නොකරන කාර්යය වන්නේ,

(1) ආයතනික කීර්තිය (2) විවිධ මත සාදන්නෝ
(3) මාධ්‍ය (4) දැන්වීම්කරණය
(5) ආයතනයට හා සම්බන්ධ පාර්ශවවල පිවිසුම

(42) සිද්ධි කළමනාකරණය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - කාල කළමනාකරණය
B - මූල්‍ය කළමනාකරණය
C - දේශපාලන කළමනාකරණය
D - අර්බුද තත්ත්ව කළමනාකරණය
E - මාධ්‍ය මඟින් ප්‍රචාරණය

මේ අතර අවම වැදගත්කමක් දැකිය හැක්කේ,

(1) A වේ. (2) B වේ. (3) C වේ.
(4) D වේ. (5) E වේ.

(43) අලෙවිකරණය පිළිබඳ මහාචාර්යවරයෙකු සිද්ධි වර්ගීකරණය කර ඇත. ඔහු,

(1) සෑම් බ්ලැක් ය. (2) එඩ්වඩ් එල් බර්නීස් ය.
(3) පිලිප් කොට්ලර් ය. (4) චාල්ස් ප්ලැකාඩ් ය.
(5) ජේම්ස් ගෲනිග් ය.

(44) යහපත් සිතින් යුතුව මානව සදාචාර සම්පන්නභාවය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මහජන සම්බන්ධතා ලෙස සරලව හැඳින්විය හැකි ය.
මෙම නිර්වචනය

(1) වෙබ්ස්ටර් කොලිජියට් ශබ්දකෝෂය (2) එඩ්වඩ් එල් බර්නීස්
(3) සෑම් බ්ලැක් (4) අයිවී ලී
(5) චාර්ල්ස් ප්ලැකාඩ්

(45) සංවර්ධන ක්‍රියාවලියේ දී රටවල් විවිධ වර්ගීකරණයන්ට ලක්වේ. පහත රටවල් අතරින් පළමු ලෝකයේ රටක් නොවන්නේ,

(1) රුසියාව (2) ජර්මනිය
(3) නෝර්වේ (4) ඩෙන්මාර්ක්
(5) ස්පාඤ්ඤය

(46) සංවර්ධනය යනු රටක දුප්පත්කම අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීමයි. මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) ඩැනියල් ලර්නර් (2) විල්බර් ශ්‍රාම්
(3) පෝල් පී ස්ටීවන් (4) එඩ්ගා ඕවන්ස්
(5) ඩඩ්ලි සියර්ස්

(47) එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සන්නිවේදනය සඳහා සන්නිවේදන ප්‍රවේශ හතරක් සඳහන් කරයි. ඊට ඇතුළත් නොවන්නේ,

(1) හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය
(2) සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය
(3) නියාමනය සඳහා සන්නිවේදනය
(4) පාරිසරික සමතුලිතතාවය සඳහා සන්නිවේදනය
(5) කාර්මීකරණය සඳහා සන්නිවේදනය

(48) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති අදියර කිහිපයක් ක්‍රියාත්මක වේ. එය සංවර්ධනය සඳහා

A - වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.
B - ක්‍රියාකාරකම් නියම කිරීම.
C - ආරම්භක හේතු හඳුනාගැනීම.
D - වැඩ පිළිවෙළ සැලසුම් කිරීම.
E - දර්ශක නිර්නය කිරීම.

මෙහි අනුපිළිවෙළ වන්නේ,

(1) A B C D හා E ය. (2) E D A B හා C ය. (3) D E C B හා A ය.
(4) C D B E හා A ය. (5) C B D E හා A ය.

(49) සංවර්ධන අපේක්ෂා අතරට අයත් නොවන්නේ,

(1) අවශ්‍යතා කේන්ද්‍රියත්වය (2) ස්වයං නිර්නය
(3) නාගරීකරණය (4) ස්වයං විශ්වාස
(5) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය

(50) සිද්ධි කළමනාකරුවෙකුගේ ගුණාංග පිළිබඳව සාකච්ඡාවක් මාධ්‍ය සමාජයේ දී ඇති විය.

A - සිද්ධි තේමාව හා ඉලක්ක හඳුනා ගැනීම.
B - මූල්‍ය පිරිවැය සැලසුම් කිරීම.
C - පිටපත ලිවීම.
D - කාර්ය සංවිධානය

එහි දී වඩාත් වැදගත් වන්නේ,

(1) A B පමණි. (2) A B C D සියල්ල. (3) AB C පමණි.
(4) B C D පමණි. (5) A B D පමණි..

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, මධ්‍ය වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Mid Term Test, March 2020**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II
## Communication and Media Studies - II

29 S II

පැය 03යි
**Three hours**

විභාග අංකය : ..................................................................

***සැලකිය යුතුයි.***

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (i) සන්නිවේදනය පිළිබඳ "ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ" නිර්වචනය ලියන්න.

(ii) සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය සංවර්ධනය වූ ආකාරය කරුණු තුනක් මඟින් දක්වන්න.

(iv) ජන සන්නිවේදන මාධ්‍ය, වර්තමාන සමාජය සමාජානුභෝජනය කරන ආකාරය කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න.

(02) සන්නිවේදනය විධිමත් මෙන්ම අවිධිමත් ලෙස ද සිදු කෙරේ.

(i) අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) පෞද්ගලිකව ඔබ විඳි අතර්‍ය සන්නිවේදන අවස්ථාවක් උදාහරණ මඟින් දක්වන්න.

(iii) රූපණ සන්නිවේදනය උදාහරණ තුනක් මඟින් පැහැදිලි කරන්න.

(iv) සන්නිවේදන ක්‍රියාවලිය ආකෘති දෙකක් සන්සන්දනය කරමින් පැහැදිලි කරන්න

(03) (i) සංස්කෘතික ප්‍රභේද හතරක් නම් කරන්න.

(ii) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ තුනක් නම් කර ඉන් දෙකක් පහදන්න.

(iii) ගෝලීය සංස්කෘතිය සමාජ නවීකරණය සඳහා බලපාන ආකාරය කරුණු තුනක් ඔස්සේ විග්‍රහ කරන්න.

(iv) සන්නිවේදන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවක් ලෙස අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(04) අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව මාධ්‍ය සාක්ෂරතාවය යි.

(i) යුරෝපා කොමිසමේ මාධ්‍ය සාක්ෂරතාවයට අදාළ නිර්වචනය ලියන්න.

(ii) මාධ්‍ය සාක්ෂරතාවයට අදාළ අංග හතරක් නම් කර ඉන් එක් කරුණක් විස්තර කරන්න.

(iii) මාධ්‍ය සාක්ෂරතාවයේ තෙවැදෑරුම් සිද්ධාන්ත විස්තර කරන්න.

(ivi) උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් ඇතිකර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ රචනයක් ලියන්න.

(05) (i) සාම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රමයක් ලෙස ජනකවිවල දක්නට ලැබෙන ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම් හතරක් නම් කර ඉන් දෙකක් පහදන්න.

(iii) නිර්මාණශීලිත්වයේ මූලිකාංග තුනක් පැහැදිලි කරන්න.

(iv) නිර්මාණශීලී භාෂා භාවිතය පිළිබඳ ව සඟරා, පුවත්පත්, ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය ඇසුරෙන් විස්තර කරන්න.

(06) (i) කැමරා කෝණ හතරක් නම් කරන්න.

(ii) රංග කලාවේ මූලිකාංග දෙකක් පහදන්න.

(iii) නිර්මාණාත්මක සන්නිවේදනය සඳහා ජනශ්‍රැති යොදාගත හැකි ආකාරය කරුණු තුනක් මඟින් පහදන්න.

(iv) සිද්ධි කළමනාකරණ අවස්ථාවක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ හැකි ආකාරය කළමනාකරුවෙකුගේ භූමිකාව ඇසුරින් පැහැදිලි කරන්න.

(07) මහජන සම්බන්ධතාවය පිළිබඳ ව ජේම්ස් ගෘනිග් හා ටොඩ් හන්ට් ඉදිරිපත් කළ ආකෘති හතර නම් කරන්න.

(i) මහජන සම්බන්ධතාව අවශ්‍ය වන අවස්ථා හතරක් නම්කර ඉන් දෙකක් පහදන්න.

(ii) සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) ඔබේ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සන්නිවේදන ක්ෂේත්‍ර කීපයක් හඳුනාගෙන ඒ පිළිබඳ රචනාවක් ලියන්න.